**කඩුවෙල මහා නගර සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 27 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 දෙසැම්බර් 14 දින සභාවට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කඩුවෙල නගර සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 නොවැම්බර් 08 දින ආයෝජනය කරන ලද රු.45,000,000 ක් වූ මහජන බැංකු තැන්පතුව වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලිය ගිණුම්ගතකර නොතිබුණි. | වර්ෂයට අදාළ පොලිය ගිණුම්ගත කළ යුතුය. | 2019 වර්ෂයේ දී ගිණුම් ගත නොවූ උපචිත පොළී ආදායම 2020 ජ'නල් 06 මඟින් ගිණුම් ගත කර ඇත. |
| (ආ) | භෞතික පැවැත්ම සනාථකර නොගත් 1998 සහ 1999 වර්ෂයන්හි සිට ගිණුම්වල පවතින වටිනාකම රු.7,561,332ක් වූ මෝටර් රථ හා කරත්ත සහ යන්ත්‍ර හා උපකරණ ගිණුම්වල ඇතුළත්කර තිබුණි. | ගිණුම්ගත කර ඇති වත්කම් වල භෞතික පැවැත්ම හඳුනාගත යුතුය. | කඩුවෙල මහා නගර සභාව ප්‍රාදේශීය සභාවක්ව පැවති අවධියේ සිට භාණ්ඩ හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව, භාණ්ඩ විනාශ කිරීමේ දී හා වෙන්දේසි කිරීමේ දී ඉවත් වන භාණ්ඩ වලපිරිවැය ස්ථාවර වත්කම් ලේඛනවලින් ඉවත් කිරීම් සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයක් පවතී. |
| (ඇ) | 2018 වර්ෂයේදී වෙන්දේසි කරන ලද වටිනාකම රු.108,740 ක් වූ ස්ථාවර වත්කම්වල පිරිවැය, ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි. | වෙන්දේසි කළ වත්කම් වල පිරිවැය ගිණුම්වලින් ඉවත් කළ යුතුය. | වෙන්දේසි කරන ලද වත්කම්වලින් හඳුනාගත් රු. 57,208 ක් වූ පිරිවැය ඉවත් කර ඇත. ඉතිරි රු. 51,532ක වටිනාකම හඳුනාගෙන ඉවත් කරමි. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ණය පදනම මත ලැබුණු කම්පැක්ටර් රථ 03ක පිරිවැය අගය රු.39,662,800 ක් ස්ථාවර වත්කම් හා ගබඩා තොග යන ගිණුම් දෙකටම හර කිරීම හා පළාත් පාලන ණය හා ගබඩා ණයහිමි යන ගිණුම් දෙකටම බැර කිරීම හේතුවෙන් ගබඩා තොග ගිණුමේ හා ගබඩා ණය හිමි ගිණුමේ වටිනාකම් වැඩියෙන් දක්වා තිබුණි. | අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතුය. | නිවැරදි ක්‍රමය යටතේ එම කම්පැක්ටර් රථ වල වටිනාකම ගබඩා තොග ගිණුම හා ගබඩා ණයහිමි ගිණුම්වලට සටහන් නොවිය යුතු ය. එම වරද ජ'නල් අංක 44 මඟින් නිවැරදි කර ඇත. |
| (ඉ) නාගරික සංවර්ධන අධිකාරි තැන්පතු ගිණුමට බැර කළ යුතු දඩ මුදල් රු.4,440,697 ක් සභාවේ ආදායමට බැරකිරීම හේතුවෙන් තැන්පතු ගිණුමේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් සහ වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතුය. | නාගරික සංවර්ධන අධිකාරිය නමින් පවත්වාගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුමේ එම මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ඉදිරි මහ සභා අනුමැතිය මත මුදල් තැන්පත් කිරීමට කටයුතු කරමි. |

**1.3.2 නොසැසඳුණු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් දෙකක එකතු වටිනාකම හා ඊට අදාළ උපලේඛණ වල එකතු වටිනාකම අතර රු.18,866,775 ක වෙනසක් විය. | ගිණුම් ශේෂ සසඳා නිවැරදි කිරීම් කළ යුතුය. | වෙනස්කම් සෙවීමට කටයුතු කරමින් පවතී. |

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **ලැබිය යුතු ගිණුම්** | | |
| මුදා තබා තිබූ කඩ කාමර 10 කින් රු.111,182 ක් හා බත්තරමුල්ල ටි.සි.වත්ත ඉඩම් කට්ටි 13 න් රු.39,930 ක කුලිය හිඟව තිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මුදා තබා ඇති කඩ කාමර නැවත ටෙන්ඩර් කැඳවා ලබා දීමටත් හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය කටයුතු කිරීමටත් යොමුකර ඇත. |
| (ආ) **ගෙවිය යුතු ගිණුම්** 2013 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන රු.38,297,434 ක් වූ ණය හිමි ශේෂය නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | 2013, 2014 සහ 2015 වර්ෂවලට අදාළව ණයහිමි ගිණුමෙහි පැවති තවදුරටත් ගෙවීමට රඳවා තබා ගත යුතු නොවන මුදල් ශේෂයන් එම ගිණුමෙන් ඉවත් කිරීම සඳහා 2018 දෙසැම්බර් මස 21 දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී අනුමැතිය ලබා ගෙන ඇත. |

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.51,153,094 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය / සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරන තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත | 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ආදායම් විෂයයන් 6 ක හිඟ මුදල් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් නොපමාව අයකර ගත යුතු වීම. | 2020.08.31 දිනට අයකිරීම්<br>රු.<br>වරිපනම් 16,614,451<br>නිවාස කුලී 22,204<br>වෙළඳ සංකීර්ණ කුලී 710,000<br>විනෝද බදු 399,584<br>17,746,239 |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු.රෙ. 371(5) | නිකුත් කළ අත්තිකාරම් රු.1,055,444ක් දෙසැම්බර් 31 දිනට පෙර පියවා නොතිබුණි. | දෙන ලද අත්තිකාරම් අප්‍රමාදව පියවා ගත යුතුය. | නොපියවූ අත්තිකාරම්වලින් රු.861,899ක් මේ වනවිට පියවා ඇත. |
| | (ii) මු.රෙ. 571 | තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු රු.13,129,404ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | කාලය ඉකුත් වූ තැන්පත් නොපමාව නිරවුල් කළ යුතුය. | ඉහත වර්ෂයන් 02 ක් ඉක්ම වූ තැන්පතු මුදල් (අංක 1, 2 සහ 3 හි සඳහන් තැන්පත්වලට අමතරව අනෙකුත් තැන්පතු) ආදායමට ගැනීමට පෙර තැන්පත්කරුවන් දැනුවත් කිරීමටත් ඊට අදාළ කටයුතු සිදු කිරීමටත් පියවර ගෙන ඇත. |

(ඇ) වෙනත් චක්‍රලේඛ
----------------------

| | | | |
|---|---|---|---|
| (i) 2016 ජුලි 11 දිනැති අංක LGD/08/2016 දරන බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | සභාව සතු පොදු දේපළ නිවැරදිව මිනුම්කර මායිම් සකස්කර පිහිටුවා ගැනීමේ කටයුත්ත මේ වන තෙක් ඉටු කර නොතිබුණි. | දේපළ නිවැරදි මිනුම් කර මායිම් සකස් කර ගත යුතුය. | මැනුම් කටයුතු සිදු කිරීම සඳහා අදාල ගිවිසුම් අත්සන් කිරීමෙන් අනතුරුව ඉඩම් 64 ක තොරතුරු මිනින්දෝරු මහතුන් වෙත ලබා දී ඇත. මේ වනවිට ඉඩම් 15 ක මිනුම් කටයුතු අවසන් කර පිඹුරුපත් ලබා දී ඇති අතර, එම ඉඩම් සඳහා අත්තිවාරම් දමා ස්ථිර මායිම් ඉදි කිරීමට අවශ්‍ය ඇස්තමේන්තු සැකසීම සඳහා තාක්ෂණ නිලධාරීන් වෙත ලබා දී ඇත. |
| (ii) 1993 නොවැම්බර් 18 දිනැති අංක 15 දරන නාගරික සංවර්ධන අධිකාරි සැලසුම් චක්‍රලේඛය | නාගරික සංවර්ධනය සඳහා පවත්වාගෙන යන බැංකු ගිණුමේ වූ රු.2,323,455 ක මුදල, හඳුනාගත් ව්‍යාපෘතියක් සඳහා යොදවා නොතිබුණි. | ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. | හඳුනාගත් ව්‍යාපෘති අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර, අනුමැතිය ලද වහාම එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ හැකි බව දන්වමි. |

**2. මූල්‍ය සමාලෝචනය**
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායමරු.485,243,772 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.948,904,276 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**
---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණු මහජන බැංකුවේ අංක 196-1-001-6-3869561 දරන ජංගම ගිණුමේ රු.542,612ක ශේෂය හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | ගිණුම් කාරක සභාවේ දී ලබාදුන් නියෝගය අනුව මෙම මුදල් පිළිබඳ පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ විමර්ශන නිලධාරීන් විසින් විමර්ශනයක් සිදුකරන ලදී. තවදුරටත් ඒ සම්බන්ධව උපදෙස් ලබා ගැනීමෙන් පසු ඉදිරියේ දී අවශ්‍ය කටයුතු සිදු කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 183,200,000 | 186,263,743 | 146,958,817 | 60,626,372 | 146,788,000 | 155,465,905 | 146,201,350 | 58,680,968 |
| (ii) කුලී | 12,095,000 | 8,730,336 | 7,347,641 | 1,259,341 | 21,980,505 | 19,511,569 | 17,753,272 | 2,749,197 |
| (iii)බලපත්‍ර ගාස්තු | 13,500,000 | 9,736,966 | 9,736,966 | - | 15,720,000 | 16,891,953 | 16,841,953 | - |
| (iv)වෙනත් ආදායම් | 1,006,133 | 715,745,598 | 322,632,304 | - | 705,689,700 | 1,066,603,602 | 464,861,872 | - |
| එකතුව | ~~209,801,133~~ | ~~920,476,643~~ | ~~486,675,728~~ | ~~61,885,713~~ | ~~890,178,205~~ | ~~1,258,473,029~~ | ~~645,658,447~~ | ~~61,430,165~~ |

### 2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කඩුවෙල දිස්ත්‍රික් කාර්යාලය, බත්තරමුල්ල කාර්යාලය සහ අතුරුගිරිය කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට වරිපනම් හිඟය රු.52,740,966ක් වූ අතර එහි වර්ෂ 01 සිට 10 දක්වා රු.20,705,878 ක් සහ වර්ෂ 10 කට වැඩි රු.4,405,066 ක් විය. | අයවිය යුතු වරිපනම් බදු අප්‍රමාදව අයකර ගත යුතුය. | දිස්ත්‍රික් කාර්යාලය / 2019. 12. 31 දිනට හිඟ මුදල / හිඟ මුදලින් 2020. 07. 31ට අයකළ මුදල<br>කඩුවෙල 15,712,085 4,101,281.75<br>බත්තරමුල්ල 23,614,458 7,377,421.31<br>අතුරුගිරිය 13,414,423 4,338,958.33 |

### 2.3.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අතුරුගිරිය මෙගාසිටි සාප්පු සංකීර්ණයේ කඩ කාමර 03 ක් හා බත්තරමුල්ල කඩ කාමරයක හිඟ කුලී ආදායම රු.59,982 ක් අයකර ගැනීමට හා කඩ කාමර විවෘත කිරීමට කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු කුලී මුදල් අප්‍රමාදව අයකර ගත යුතුය. | හිඟ කුලී මුදල් ගෙවන ලෙස බදු කරුවන් දැනුවත් කර ඇත. |

2.3.4 **වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) විනෝද බදු** | | |
| අවුරුදු 03 කට වැඩි කාලයක සිට අයවිය යුතුව පවතින රු.1,579,292 ක් වූ විනෝද බදු අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | අයවිය යුතු බදු අප්‍රමාදව අයකර ගත යුතුය. | සම්පූර්ණ හිඟ මුදල අයකර ගැනීම සඳහා නඩු ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. |
| **(ආ) සතිපොළ බදු** | | |
| වසර 05 කට වැඩි කාලයකසිට කඩුවෙල සතිපොලෙන් අයවිය යුතු රු.368,126 ක් ප්‍රවර්ථන වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි. | අයවිය යුතු බදු අප්‍රමාදව අයකර ගත යුතුය. | 2012 වර්ෂයේ සිට පවතින හිඟයකි. මෙම හිඟ මුදල සම්බන්ධව ගිණුම් කාරක සභාවේ නිර්දේශය මත පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂණයක් සිදු කර ඇත. එහි උපදෙස් මත අවශ්‍ය කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

මහා නගර සභා ආඥා පනතේ 4 වනවගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහා නගර සභා ආඥා පනතේ 272(28) වගන්තිය ප්‍රකාරව අතිරේක ආදායම් උපයා ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථාවන් සම්පාදනය කොට අනුමැතිය ලබා ගතයුතු වුවද ආදායම් මාර්ග 05 ක් සම්බන්ධයෙන් එසේ අතුරු ව්‍යවස්ථා සකස් නොකොට සමාලෝචිත වර්ෂයේදී රු.18,745,262 ක ආදායමක්, උපයාගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා සකස් කොට අනුමත කර ගත යුතුය. | අතුරු ව්‍යවස්ථා අනුමැතිය සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත යවා ඇත. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමණාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතුව වාහන හා සේවක සම්පත් තිබියදී කසළ බැහැර කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.65,107,270ක් බාහිර කොන්ත්‍රාත් ආයතන 10 කට ගෙවා තිබුණි. | සභාවට වාසිදායක අයුරින් කටයුතු කළ යුතුය. | කසළ බැහැර කිරීමේ කටයුතු සහ කොම්පොස්ට් නිෂ්පාදන කටයුතු මේ වන විට බස්නාහිර අප ද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය හා එක්ව සකස් කරන ලද සැලැස්මට අනුව ක්‍රියාත්මක කරනු ලබයි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **මහජන පැමිණිලි** | | |
| සමාලෝචිත වර්ෂය තුළදී පොදු මහජන පැමිණිලි සහ අනවසර ඉදිකිරීම් බාණ්ඩ යටතේ පැමිණිලි 597 ක් නගර සභාවට ඉදිරිපත්කර තිබුණු අතර එයින් ක්‍රියාමාර්ග ගෙන තිබුණේ පැමිණිලි 148ක් සම්බන්ධයෙන් පමණි. | මහජන පැමිණිලි සම්බන්ධව අප්‍රමාදව ක්‍රියාමාර්ගගත යුතුය. | ක්‍රියාමාර්ග ගනිමින් පවතී |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරුවල පුරප්පාඩු 31 ක් පැවතුණි. | අත්‍යවශ්‍ය සේවක පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. | මාණ්ඩලික - ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.<br>ද්විතියික - අධිකරණ ක්‍රියාමාර්ගයක් පවතින බැවින් බඳවා ගැනීම් කළ නොහැක.<br>ප්‍රාථමික - සුදුසුකම්ලාභීන් නොසිටිම./ අනුමැතියට යවා ඇත. |

(ආ) **සේවක ණය**

--------------

| | | |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 31 දෙනෙකුගෙන් රු.1,507,762 ක් ද, විශ්‍රාම ගිය නිලධාරීන් 40 දෙනෙකුගෙන් රු.539,860 ක් ද, සේවය අත්හිටවූ නිලධාරීන් 08 දෙනෙකුගෙන් රු.125,848ක් හා සේවය අත්හැර ගිය නිලධාරීන් 51 දෙනෙකුගෙන් රු.1,186,486ක් ද අය විය යුතුව තිබුණි. | හිඟ සේවක ණය ශේෂයන් අප්‍රමාදව අයකරගත යුතුය. | 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ ශේෂවල එකතුව රු.85,455,855 කි. එම නිලධාරීන්ගෙන් 10 දෙනෙකු රු.1,294,261 ක් වැටුපෙන් අවකරණ ලෙස ගෙවනු ලැබේ. ඉදිරියේදී ඉතිරි ණය ශේෂ පියවීමට කටයුතු කරනු ලැබේ. |

**3.4 මතභේදයට තුඩුදුන් ගණුදෙනු**

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අතුරුගිරිය දිස්ත්‍රික් කාර්යාලය අතුරුගිරිය මෙගාසිටි සාප්පු සංකීර්ණයේ ස්ථාපිත කිරීම සඳහා 2019 වර්ෂය තුළදී පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත රු.3,253,840 ක් ගෙවා වර්ග අඩි 1300ක පරිශ්‍රයක යකඩ කණු මත තහඩු පෘෂ්ඨයක කොන්ක්‍රීට් ස්ලැබ් එකක් දමා තිබුණද 2019 දෙසැම්බර් 31 තෙක් උපකාර්යාලය ස්ථාපිත කර නොතිබුණි. | වියදම් දැරීමේදී සභාව නිසි සැලසුමකට අනුව ක්‍රියාකළ යුතුය. | කරුණු සාකච්ඡා කර බැලූ විශේෂ තාක්ෂණික කමිටුව, යෝජිත ව්‍යාපෘතිය සභාවේ අවශ්‍යතා මූලික කර ගනිමින් අවම පිරිවැයකින් සෘජු ශ්‍රමය හා ප්‍රජා පාදක කොන්ත්‍රාත් පදනම යටතේ සභාවට උපදේශන සේවාව සපයන ව්‍යුහ ඉංජිනේරු ප්‍රමාණ සමීක්ෂණ හා වාස්තු විද්‍යාඥ සමීප අධීක්ෂණය යටතේ ඉටු කරවා ගැනීමට නිර්දේශ කර ඇත. ඒ අනුව, මේ වනවිට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) ජයවඩනගම නිවාස සංකීර්ණයේ ප්‍රජා ශාලාව 2013 සැප්තැම්බර් 24 වන දින සිට මාසිකව රු.25,000 බැගින් වූ කුලියක් මත වර්ෂ 03 ක කාලයක් සඳහා සහ 2018 නොවැම්බර් මස 07 දින ටෙන්ඩර් කැඳවා මසකට රු.70,000ක් බැගින් වූ බදු කුලියක් මත වර්ෂ 05ක් සඳහා ලබා දී තිබුණි. | නිවැසියන්ගේ අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවය දී කටයුතු කළ යුතුය. | 2018. 11. 07 වන දින ජයවඩනගම ප්‍රජා ශාලාව බඳුදීමෙන් පසු, බදු ගිවිසුමේ සඳහන් පරිදි 13 වන කොන්දේසිය කඩ කර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. |
| බදු ගිවිසුමේ 13 වන වගන්තියට පටහැනිව ගොඩනැගිල්ලේ ස්වභාවය හා ආකෘතිය වෙනස් කර උත්සව ශාලාවක් බවට පත්කර තිබීම නිසා නිවාස සංකීර්ණයේ නිවැසියන්ට ඔවුන්ගේ පොදු අවශ්‍යතා ඉටුකර ගැනීමට එම ස්ථානය අහිමිව තිබුණි. | | ජයවඩනගම ප්‍රජා ශාලාව බඳුදීම සම්බන්ධයෙන් ඇති කර ගත්තා වූ ගිවිසුම අනුව නිවාස සංකීර්ණයේ පදිංචිකරුවන් සඳහා සියයට 10 ක වට්ටමක් සහිතව සේවාව සැපයීම කළ යුතු බව ගිවිසුමේ 3 කොටස යටතේ සඳහන්ව ඇති බව දන්වමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **පොදු පහසුකම් ඉඩම්වල අනවසර පදිංචිකරුවන් පදිංචි වීම**<br>ඉඩම් කට්ටි කර විකිණීමේදී පොදු පහසුකම් සඳහා සභාවට ලැබුණු ඉඩම් කැබලි 04 ක් පෞද්ගලික පාර්ශවයන් විසින් අනවසරයෙන් භුක්ති විඳිමින් පැවතුණි. | සභා සතු ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගත යුතුය. | මායිම් තහවුරු කර අවශ්‍ය ඉදිරි කටයුතු කරමි. |

**3.5.2 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කඩුවෙල පොල ප්‍රතිස්ථාපනය කිරීම සඳහා හෙක්ටයාර් 0.98211 ක ඉඩම අත්පත්කර ගැනීමට කළමනාකරණ සේවා ගාස්තු ලෙස රු.6,600,000 ක් සහ අත්පත්කර ගැනීමේ වන්දි මුදල රු.73,425,000 ක් වශයෙන් එකතුව රු.80,025,000 ක් 2014 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණු අතර මේ සඳහා ලබා ගත් මිලියන 40 ක ණය මුදලක් වෙනුවෙන් වාරික හා පොලී ලෙස රු.26,768,135ක් ගෙවා තිබුණි. එසේ වුවද මේ වනතෙක්ම ඉඩමේ හිමිකරුවන් වෙත නාගරික සංවර්ධන අධිකාරිය විසින් වන්දි මුදල් ගෙවා නොතිබු අතර සතිපොළ පිහිටි ඉඩම සභාව වෙත පවරා ගැනීමටද කටයුතුකර නොතිබුණි. | පවරා ගැනීමේ කටයුතු අප්‍රමාදව සිදුකළ යුතුය. | මූලික පිඹුරුපත් අංක 9657 හි කැබලි අංක 01 සිට 08 දක්වා වන බිම් කැබලිවලින් කැබලි අංක 01,03,04,06 හා 07 සඳහා වන්දි තක්සේරු මුදල වන රු.350,355,000ක මුදලින් 90% ක් වූ රු.315,319,500 ක මුදලක් අදාළ ඉඩම් කොටස් සඳහා වන්දි වශයෙන් වාරික 06 කින් ලබා ගැනීමට වන්දි හිමි පාර්ශවයන් සාකච්ඡා මාර්ගයෙන් එකඟ කරවා ගෙන එයට අදාළ දිවුරුම් ප්‍රකාශ මේ වනවිට ප්‍රාදේශීය ලේකම් වෙත ද යොමු කර ඇත. අදාළ මුදල් ලබාදීමෙන් පසු නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් සතිපොළ භූමිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ හැක. |

3.5.3 **නිෂ්ක්‍රීය / ඌණ උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.53,351,000 ක් වූ කාපට් ඇතිරීමේ යන්ත්‍ර 03 ක්, වටිනාකම සොයා ගත නොහැකි ටේලර් රථ 03 ක් හා ආයුර්වේදයේ කොළ කැඳ පිළියෙල කිරීමේ උපකරණ 19 ක් නිශ්ක්‍රීයව පැවතුණි. | වත්කම් උපරිමයෙන් උපයෝජනය කළ යුතු වීම. | භාණ්ඩ සමීක්ෂණය අවසානයේ මෙම උපකරණ ඵලදායී ලෙස යොදා ගැනීමට / වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

**3.6** හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කඩුවෙල උපකාර්යාලයේ ගබඩා ඒකකයේ තිබූ වටිනාකම රු.231,332ක් වූ කොඩිකණු 234 ක් අස්ථානගත වී තිබුණි. | කොඩි කණු ආපසු ගෙන්වා ගත යුතු වේ. | මෙම කොඩි කණු 234 ලබා ගත් ප්‍රජා මණ්ඩල වෙතින් ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. මේ වන විට ලිඛිතව සියළුම කොඩි කණුවල භාර කාරීත්වය නිලධාරියෙකු වෙත පවරා ඇත. |
| (ආ) කඩුවෙල බස් නැවතුම්පලෙහි සනීපාරක්ෂක කටයුතු, වැසිකිළි පද්ධතිය පිරිසිදු කිරීම සහ පවිත්‍රතා කටයුතු 2019 පෙබරවාරි දක්වා සභාවේ සේවකයන් යොදවා කර තිබූ අතර බාහිර පාර්ශවයන් වෙත රු.10 ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම මගින් 2018 ජනවාරි සිට 2019 පෙබරවාරි දක්වා ඉපැයූ ආදායම රු.1,325,341 ක් විය. මෙය දළ වශයෙන් මසකට රු.95,000 ක පමණ ආදායමක් විය. එසේ තිබියදී මෙම සේවාව බාහිර පාර්ශවයකට ලබා දීමට 2018 දෙසැම්බර් 31 දිනැති මහා සභාව තීරණය කර තිබූ අතර ඒ අනුව මිල ගණන් කැඳවා මසකට රු.5,010ක මාසික කුලියකට පෞද්ගලික සැපයුම්කරුවකුට 2019 පෙබරවාරි 01 දින පවරා තිබුණි. මේ හේතුවෙන් සභාවට මසකට රු.90,000 ක පමණ පාඩුවක් සිදුවී තිබුණි. | සභාවට අවාසිදායක ගිවිසුම්වලට නොඑළඹීමට වගබලා ගත යුතුය. | අදහස් දක්වා නොමැත. |

## 4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

### 4.1 අභ්‍යන්තර විගණනය

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂය සඳහා සභාවේ ඉදිකිරීම් කර්මාන්ත, කසළ බැහැර කිරීමේ ක්‍රියාවලිය සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුය. | 2019 වර්ෂය තුළ විමසුම් 15 ක් අභ්‍යන්තර විගණන නිලධාරී විසින් මා වෙත ඉදිරිපත් කර ඇත. එම විමසුම්වලදී ආවරණය නොවූ අංශ පිළිබඳ වැඩි අවධානයක් යොමු කර කටයුතු කරන ලෙස අභ්‍යන්තර විගණන නිලධාරී දැනුවත් කිරීමට කටයුතු කරමි. |